2021

වාර්ෂික වාර්තාව

வருடாந்த அறிக்கை

ANNUAL REPORT



GALLE
HERITAGE
FOUNDATION

ගාලු උරුමය පදනම

ජාතික උරුම,ප්‍රාසාංග කලා හා ග්‍රාමීය කලා ශිල්පී ප්‍රවර්ධන කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය

காலி மரபுரிமை மன்றம்
தேசிய மரபுரிமைகள், அருங்கலைகள் மற்றும் கிராமிய சிற்பக்கலைகள் மேம்பாட்டு அலுவல்கள் இராஜாங்க அமைச்சு

Galle Heritage Foundation

State Ministry of National Heritage, Performing Arts and Rural Arts Promotion

2021 වාර්ෂික වාර්තාව

GALLE
HERITAGE
FOUNDATION

ගාලු උරුමය පදනම

ජාතික උරුම,ප්‍රාසාංග කලා හා ග්‍රාමීය කලා ශිල්පී ප්‍රවර්ධන

කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය

ලිපිනය	:-	අංක 12, රම්පාට් වීදිය, කොටුව, ගාල්ල.
දුරකථන අංක	:-	091-2246784 / 091-2231982
ෆැක්ස් අංකය	:-	091-2246784
ඊ මේල්	:-	herifo@sltnet.lk
වෙබ් අඩවිය	:-	www.galleheritage.gov.lk

පටුන

I පරිච්ඡේදය.....1

ගාලු උරුමය පදනම.....1

1.1 හැඳින්වීම.....1
1.2 දැක්ම මෙහෙවර සහ අගයන්.....1
1.3 ගාලු උරුම පදනමෙහි බලසීමාවට අයත් භූමි ප්‍රදේශය.....2

1.3.1ලෝක උරුම ගාලු කොටුවේ සිතියම.....2

1.3.2ගාලු කොටුවේ භෞතික පරිසරය.....3

1.4 ගාලු උරුම පදනමේ මූලික අංශ.....3
1.5 ගාලු උරුමය පදනමේ සංවිධාන සටහන.....4
1.6 ගාලු උරුම පදනමේ කාර්යය මණ්ඩලය.....5
1.6.1 කාර්යය මණ්ඩලයේ වැටුප් පරිමාණ.....6
1.6.2 කාර්ය මණ්ඩලයේ සේවා කාලය පිළිබඳ තොරතුරු.....7
1.6.3 කාර්ය මණ්ඩලයේ ඇති වූ වෙනස්කම් 2021 වසර.....8
1.6.4 ගාලු උරුමය පදනමේ සේවය කළ සභාපතිවරු පිළිබඳ තොරතුරු.....8
1.6.5 ගාලු උරුමය පදනමේ ප්‍රධාන විධායක නිලධාරි ධුරය දැරුවන්ගේ තොරතුරු.....9
1.6.6 ගාලු උරුමය පදනමේ පරිපාලන නිලධාරි තනතුරු දැරූ අයගේ තොරතුරු.....9
1.7 ගාලු උරුමය පදනමේ පරිපාලන නිලධාරි තනතුරු දැරූ අයගේ තොරතුරු.....10
1.7.1 ගාලු උරුමය පදනමේ කළමනාකරණ මණ්ඩල සාමාජිකයි 2021 වර්ෂය.....10-12

II වනපරිච්ඡේදය.....13
2021 ගාලු උරුමය පදනම විසින් සිදු කරන ලද වැඩසටහන්.....13
2.1 පොදු වැඩසටහන්.....13

2.2 සංවර්ධන ව්‍යාපෘති.....14

2.2.1 ගාලු උරුමය පදනම ප්‍රධාන කාර්යාලය පවත්වාගෙන යන ගොඩනැගිල්ල අලුත්වැඩියා කිරීමේ ව්‍යාපෘතිය...14

2.2.2 ගාලු කොටුවේ පිහිටි රාජ්‍ය ආයතන විසින් භාවිතා කරනු ලබන පැරණි ගොඩනැගිලි සංරක්ෂණය කිරීම සඳහා සැලසුම්සකස් කිරීමේ ව්‍යාපෘතිය.....15

2.2.3 පැරණි පොලිස් නිල නිවාස ගොඩනැගිල්ල සංරක්ෂණය කිරීම.....15

2.2.4 ගාලු කොටුවේ පැරණි ඇලි වීදි සංවර්ධනය කිරීම.....16

2.2.5 ගාලු උරුමයට අයත් සිප්නාරා පරිශ්‍රය බොජුන්හලක් ලෙස සංවර්ධනය කිරීම.....17

2.2.6 සඳු ගැලරියේ සංවර්ධන කටයුතු.....18

2.2.7 ගාලු කොටුව ප්‍රදීපාගාරය අසළ වෙරළ තීරය සංවර්ධනය.....18-19

2.2.8 තොරතුරු මධ්‍යස්ථානයේ නවීකරණ කටයුතු.....20

2.3 වෙනත් වැඩසටහන්.....21-22

2.4 2021.12.31 දිනෙන් අවසන් වන දිනට විගණකාධිපති වාර්තාවේ සිංහල පිටපත.....23-31

2.5 2021 වර්ෂය තුළ ගාලු උරුමය පදනමේ කාර්යසාධනය පිළිබඳව සංක්ෂිප්ත වාර්තාව.....32

2.6 කාර්ය සාධනය වර්ධනය කර ගැනීම සඳහා අනුගමනය කිරීමට අපේක්ෂිත කෙටිකාලීන හා මධ්‍යකාලීන ක්‍රියාමාර්ග.....33

2.7 අමාත්‍ය මණ්ඩලයේ අවධානය යොමුවිය යුතු ආයතනයට වැදගත් වෙනත් කරුණු.....33

2.8 2021 වර්ෂයේ විගණකාධිපති විමසුම් අනුව ගෙන ඇති ක්‍රියාමාර්ග.....34-46

2.9 කාර්යසාධන වාර්තාවේ දෙමළ පරිවර්ථනය.....47-68

2.9.1 2021 වර්ෂය තුළ ගාලු උරුමය පදනමේ 69-74

2.9.2 2021 වර්ෂය තුළ ගාලු උරුමය පදනමේ කාර්යසාධනය පිළිබඳ සංක්ෂිප්ත වාර්තාව දෙමළ පිටපත..... 75

2.10 කාර්යසාධන වාර්තාවේ ඉංග්‍රීසි පිටපත.....76-97

2.10.1 2021.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශය.....98-116

2.10.2 2021.12.31 දිනෙන් අවසන් වන දිනට විගණකාධිපති වාර්තාවේ ඉංග්‍රීසි පිටපත.....117-122

2.10.3 2021 වර්ෂය තුළ ගාලු උරුමය පදනමේ කාර්යසාධනය පිළිබඳ සංක්ෂිප්ත වාර්තාවේ ඉංග්‍රීසි පිටපත.....123

I වැනි පරිච්ඡේදය

ගාලු උරුමය පදනම

1.1 හැඳින්වීම

ගාලු උරුමය පදනම 1994 අංක 07 දරන පාර්ලිමේන්තු පනත මඟින් රජයේ ව්‍යවස්ථාපිත ආයතනයක් ලෙස පිහිටුවනු ලැබීය. එහි ප්‍රධාන අරමුණු වූයේ ගාලු කොටුව සහ එහි ඓතිහාසික පශ්චාත් භූමිය ප්‍රවර්ධනය කිරීම, ආරක්ෂා කිරීම, සංරක්ෂණය කිරීම සහ සංවර්ධනය කිරීමයි. මෙතෙක් විවිධ අමාත්‍යාංශ යටතට පත්වූ ගාලු උරුමය පදනම වර්තමානයේ ජාතික උරුම,ප්‍රාසාංග කලා හා ග්‍රාමීය කලා ශිල්පී ප්‍රවර්ධන කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වේ.

ගාලු කොටු පවුර පුරාවිද්‍යා ස්මාරකයක් ලෙස 1971 දී ගැසට් කිරීමත්, 1988 දී යුනෙස්කෝව විසින් ලෝක උරුම ස්ථානයක් වශයෙන් ප්‍රකාශයට පත් කිරීම හේතුකොට ගෙන රජයේ සහ මහජනයාගේ වැඩි අවධානය එයට යොමුවීමත් සමඟ මෙහි ආරක්ෂාව හා සංරක්ෂණය සඳහා ගාලු උරුමය පදනම විසින් විවිධ පියවර ගනු ලැබිණ.

1.2 දැක්ම මෙහෙවර සහ අගයන්

දැක්ම

''2025 දී ශ්‍රී ලංකාවේ විශිෂ්ඨතම සංස්කෘතික සංචාරක පුරවරය ජීවමාන ලෝක උරුම ගාලු කොටුවයි''

මෙහෙවර

ඓතිහාසික සංස්කෘතික මධ්‍යස්ථානයක් සහ පුරාවිද්‍යාත්මක වැදගත්කමක් ඇති ප්‍රදේශයක් ලෙස ගාලු කොටුව සංරක්ෂණය කිරීම හා විශිෂ්ඨතම සංචාරක පුරවරයක් ලෙස ප්‍රවර්ධනය කිරීම .

- සුවිශේෂී විශ්වීය වටිනාකමකින් යුතු ලෝක උරුමයක් ලෙස ගාලු කොටුවේ සංවර්ධනයට දායක වීම.
- ගාලු කොටුවේ සුවිශේෂී පුරාවිද්‍යාත්මක වටිනාකම ආරක්ෂා කරන අතරම, ආකර්ෂණීය සංචාරක පුරවරයක් සඳහා අවශ්‍ය පහසුකම් සලසා දීම.
- ප්‍රජා මතයන්ට ගරු කරමින් තීන්දු තීරණ ගැනීමේදී ප්‍රජා සහභාගීත්වය ද ලබාගනිමින් ලෝක උරුමයක් ලෙස ගාලු කොටුව පවත්වාගෙන යාම.
- ජනතාවගේ ජීවනෝපාය නගාසිටුවීමට සෘජුව හා වක්‍රව දායක වීම.

1.3 ගාලු උරුමය පදනමෙහි බලසීමාවට අයත් භූමි ප්‍රදේශය

යුනෙස්කෝ ආයතනය මගින් ලෝක උරුමයක් ලෙස ප්‍රකාශයට පත්කර ඇති ගාලු කොටුව ගාලු උරුමය පදනමේ වපසරියට අයත් වේ. මුර අට්ටාල 14කින් සමන්විත මෙම කොටුවේ කොටු බැමීමේ දිග ප්‍රමාණය ආසන්න වශයෙන් කි.මී.2.5ක් පමණය.

1.3.1 ලෝක උරුම ගාලු කොටුවේ සිතියම



ගාලු උරුමය පදනම මගින් සංරක්ෂණය කොට ළමා කෞතුකාගාරයක් බවට පරිවර්තනය කිරීමට අදහස් කර ඇත්තේ සඳු අට්ටාලයේ පිහිටි යුධ කාමරයයි.

1.3.2 ගාලු කොටුවේ භෞතික පරිසරය

ශ්‍රී ලංකාවේ දකුණු පළාතේ ගාල්ල දිස්ත්‍රික්කයේ කඩවත්සතර ප්‍රාදේශිය ලේකම් කොට්ඨාස බල ප්‍රදේශය තුළ පිහිටි 96 ඩී ග්‍රාමසේවා වසම ගාලු කොටුව අයත් ප්‍රදේශය වේ. ප්‍රමාණයෙන් අක්කර 80.9067 (හෙක්ටෙයාර් 32.7418) ක භූමි භාගයකින් ගාලු කොටුව සමන්විත වේ.

1.4 ගාලු උරුමය පදනමේ මූලික අංශ



1.5 ගාලු උරුමය පදනමේ සංවිධාන සටහන

යෝජිත කාර්යය මණ්ඩලය ඇතුළත් සංවිධාන සටහන



1.6 ගාලු උරුමය පදනමේ කාර්යය මණ්ඩලය

අනු අංකය	නම	තනතුර
1.	පරාක්‍රම දහනායක මහතා	සභාපති
2.	සුනිල් දහනායක මහතා	අධ්‍යක්ෂ
3.	ඩබ්.පී.ආර්. අනුරුද්ධ මයා	ගිණුම් නිලධාරි
4.	එල්.ඒ. තරංග පුෂ්පකුමාර මයා	ව්‍යාපෘති සහකාර තනතුරට අනුයුක්ත සංවර්ධන නිලධාරි
5.	පී.ජී.එන්.වන්දිමාලි මිය	ව්‍යාපෘති සහකාර තනතුරට අනුයුක්ත සංවර්ධන නිලධාරි
6.	එස්.පී.ලොකුලියන මිය	ව්‍යාපෘති සහකාර තනතුරට අනුයුක්ත සංවර්ධන නිලධාරි
7.	එන්.රිද්මි යසිතා මිය	ව්‍යාපෘති සහකාර (ගිණුම්)තනතුරට අනුයුක්ත සංවර්ධන නිලධාරි
8.	ආර්.ආර්.එන්.රණසිංහ මයා	ව්‍යාපෘති සහකාර තනතුරට අනුයුක්ත සංවර්ධන නිලධාරි
9.	ආර්.ඒ.එන්.පී. මධුසංක මයා	ව්‍යාපෘති සහකාර තනතුරට අනුයුක්ත සංවර්ධන නිලධාරි
10.	බී .එස්. ඉලේපෙරුම මිය	කළමනාකරණ සහකාර
11.	ඩබ් .ඩිලානි හර්ෂිකා මෙනවිය	කළමනාකරණ සහකාර
12.	එම්.එච්. ඉෂානි ප්‍රියදර්ශනි මිය	කළමනාකරණ සහකාර
13.	එම්.එච්.ෆාතිමා ෆවුසනා මිය	කළමනාකරණ සහකාර
14.	ඒ.ජී. සමන් කුමාර මයා.	කර්යාල කාර්ය සහායක
15.	එම්.එල්.එස්.ජයසේකර මයා	ආරක්ෂක නියාමක
16.	ඩබ්.ජී.නන්දන සමන්ත මයා	ආරක්ෂක නියාමක
17.	එම්.ඊ.එන්. ශිරන්ත ද සිල්වා මයා	රියදුරු

1.6.1 කාර්යය මණ්ඩලයේ වැටුප් පරිමාණ

අනු අංකය	තනතුර	වැටුප් සංකේත අංකය	අනුමත සංඛ්‍යාව	දැනට සිටින සංඛ්‍යාව
1.	සභාපති	පී ඩී 3/2015 චක්‍රලේඛය පරිදි දීමනා ගෙවා ඇත.	01	01
2.	අධ්‍යක්ෂ	එම් එම් 1-1	01	01
3.	පරිපාලන නිලධාරී	ජේ එම් 1-1	01	01
4.	ගිණුම් නිලධාරී	ජේ එම් 1-1	01	01
5.	ව්‍යාපෘති සහකාර තනතුරට අනුයුක්ත සංවර්ධන නිලධාරි	එම් එන් 4	05	05
6.	ව්‍යාපෘති සහකාර (ගිණුම්)තනතුරට අනුයුක්ත සංවර්ධන නිලධාරි	එම් ඒ 3	01	01
7.	කළමනාකරණ සහකාර	එම් ඒ 1-1	04	04
8.	කාර්යාල කාර්ය සහයක	පී එල් 1	01	01
9.	ආරක්ෂක නියාමක	පී එල් 1	04	02
10.	රියදුරු	පී එල් 3	01	01

1.6.2 කාර්ය මණ්ඩලයේ සේවා කාලය පිළිබඳ තොරතුරු

අනු අංකය	නම	තනතුර	සේවා කාලය
1.	පරාක්‍රම දහනායක මහතා	සභාපති	2020.01.24 සිට මේ දක්වා
2.	සුනිල් දහනායක මහතා	අධ්‍යක්ෂ	2020.08.19 සිට මේ දක්වා
3.	සීතා පී ලියනගේ මිය	පරිපාලන නිලධාරී	2006.01.02 සිට 2020.09.04
4.	ඩබ්.පී.ආර්. අනුරුද්ධ මයා	ගිණුම් නිලධාරී	2017.07.17 සිට මේ දක්වා
5.	එල්.ඒ.තරංග පුෂ්පකුමාර මයා	ව්‍යාපෘති සහකාර තනතුරට අනුයුක්ත සංවර්ධන නිලධාරී	2006.08.01 සිට මේ දක්වා
6.	පී.ජී.එන්.චන්දිමාලි මිය	ව්‍යාපෘති සහකාර තනතුරට අනුයුක්ත සංවර්ධන නිලධාරී	2006.08.01 සිට මේ දක්වා
7.	එස්.පී.ලොකුලියන මිය	ව්‍යාපෘති සහකාර තනතුරට අනුයුක්ත සංවර්ධන නිලධාරී	2006.08.01 සිට මේ දක්වා
8.	එන්.රිද්මි යසිතා මිය	ව්‍යාපෘති සහකාර (ගිණුම්)තනතුරට අනුයුක්ත සංවර්ධන නිලධාරී	2020.05.12 සිට මේ දක්වා
9.	ආර්.ආර්.එන්.රණසිංහ මයා	ව්‍යාපෘති සහකාර (ගිණුම්)තනතුරට අනුයුක්ත සංවර්ධන නිලධාරී	2021.04.08 සිට මේ දක්වා
10.	ආර්.ඒ.එන්.පී. මධුසංක මයා	ව්‍යාපෘති සහකාර (ගිණුම්)තනතුරට අනුයුක්ත සංවර්ධන නිලධාරී	2021.04.08 සිට මේ දක්වා
11.	බී.එස්. ඉලේපෙරුම මිය	කළමනාකරණ සහකාර (තා.නො.)	2005.11.02 සිට මේ දක්වා
12.	ඩිලානි හර්ෂිකා වික්‍රමසූරිය මෙ.වි	කළමනාකරණ සහකාර (තා.නො.)	2015.09.01 සිට මේ දක්වා
13.	එම්.එච්.එම්.ඉෂානි ප්‍රියදර්ශනි මිය	කළමනාකරණ සහකාර (තා.නො.)	2015.09.01 සිට මේ දක්වා
14.	එම්.එච්.ෆාතිමා ෆවුසානා මිය	කළමනාකරණ සහකාර (තා.නො.)	2015.09.01 සිට මේ දක්වා
15.	ඒ.ජී.සමන් කුමාර මයා	කාර්යාල කාර්ය සහායක	2012.12.03 සිට මේ දක්වා
16.	එම්.එල්.එස්.ජයසේකර මයා	ආරක්ෂක නියාමක	2012.12.03 සිට මේ දක්වා
17.	ඩබ්.ජී. නන්දන සමන් මයා	ආරක්ෂක නියාමක	2012.12.03 සිට මේ දක්වා
18.	නෙව්මාල් ශිරන්ත ද සිල්වා මයා	රියදුරු	2012.12.03 සිට මේ දක්වා

1.6.3 කාර්ය මණ්ඩලයේ ඇති වූ වෙනස්කම් 2021 වසර

- ❖ ගාලු උරුමය පදනමේ පරිපාලන නිලධාරී සීතා.පී.ලියනගේ මියගේ සේවා කාලය 2020.09.04 දිනෙන් අවසන් විය. 2020.09.05 දින සිට 2021.12.31 වන තෙක් පරිපාලන නිලධාරී තනතුර පුරප්පාඩුව පවතී.
- ❖ පුරප්පාඩුව පවතින පරිපාලන නිලධාරී ධුරයේ රාජකාරී ආවරණය කිරීම සඳහා 2021.03.01 දින සිට 2021.08.31 දක්වා මාස 06 ක කාලසීමාවක් සඳහා කළමනාකරණ සහකාර තනතුරේ සේවය කරන බී.එස්.ඉලේපෙරුම මිය වෙත රාජකාරී පවරන ලදී.
- ❖ 2021.04.08 දින සිට ජාතික උරුම, ප්‍රාසාංග කලා හා ග්‍රාමීය කලා ශිල්පී ප්‍රවර්ධන කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය මගින් සංවර්ධන නිලධාරී III ශ්‍රේණියේ ආර්.ආර්.එන්. රණසිංහ මයා සහ ආර්.ඒ.එන්.පී. මධුසංක මයා ගාලු උරුමය පදනමේ ව්‍යාපෘති සහකාර තනතුරු සඳහා අනුයුක්ත කර ඇත.

1.6.4 ගාලු උරුමය පදනමේ සේවය කළ සභාපතිවරු පිළිබඳ තොරතුරු

අනු අංකය	නම	තනතුරට පත්වූ වසර	සේවාව අවසන් කළ වර්ෂය
1.	රූපා කරුණාතිලක මැතිතුමා(ගරු වැවිලි කර්මාන්ත අමාත්‍ය)	1989	1994
2.	නෙවිල් කනකරත්න මැතිතුමා(දකුණු පළාත් ගරු ආණ්ඩුකාර)	1994	2000
3.	ආචාර්ය රිවඩ් පතිරණ මැතිතුමා	2000	2002
4.	රියෙන්සි විජේතිලක මැතිතුමා(හැටන් නැෂනල් බැංකුව ,සභාපති)	2002	2003
5.	වජිර අබේවර්ධන මැතිතුමා(ගරු රාජ්‍ය පරිපාලන කටයුතු අමාත්‍ය)	2003	2004
6.	එච්.ජී.අජිත් කුමාර මහතා(ගාල්ල දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී)	2004	2007
7.	පරාක්‍රම දහනායක මැතිතුමා (නාගරික මන්ත්‍රී, ගාල්ල මහ නගර සභාව)	2007	2015
8.	රම්‍ය සිරිවංශ මැතිතුමා (විශ්‍රාමික දිස්ත්‍රික් ලේකම්)	2015	2016
9.	චන්න දාස්වත්ත මැතිතුමා (වරලත් චිත්‍රශිල්පය ගෘහ නිර්මාණ ශිල්පී)	2016	2019
10.	පරාක්‍රම දහනායක මැතිතුමා (නාගරික මන්ත්‍රී, ගාල්ල මහ නගර සභාව)	2020	මේ දක්වා

1.6.5 ගාලු උරුමය පදනමේ ප්‍රධාන විධායක නිලධාරී ධුරය දැරුවන්ගේ නොරතුරු

අනු අංකය	නම	තනතුරට පත්වූ වසර	සේවාව අවසන් කළ වර්ෂය
1.	පී .හේවාවසම් මහතා (ගාල්ල ,හිටපු දිසාපති)	2001.12.15	2004.04.01
2.	පී විජේරත්න මහතා (ගාල්ල ,හිටපු අතිරේක දිසාපති)	2004.06.28	2005.12.31
3.	ඕ.එස් .එන් ද සිල්වා මහතා (හිටපු ප්‍රාදේශිය කළමණාකරු, ලංකා බැංකුව)	2006.01.12	2007.02.28
4.	එච්.එල්.ගුණවර්ධන මහතා (හිටපු ප්‍රාදේශිය ලේකම්, ගාල්ල කඩවත්සතර)	2007.04.11	2018.04.20
5.	ඩී.කේ.එස්.ජයලක්ෂ්මී මහත්මිය (හිටපු ප්‍රාදේශිය ලේකම්, බද්දේගම)	2019.04.29	2020.04.25
6.	සුනිල් දහනායක මහතා (නියෝජ්‍ය ප්‍රධාන ලේකම්, මූල්‍ය කළමනාකරණ, දකුණු පළාත් ප්‍රධාන ලේකම් කාර්යාලය)	2020.08.19	මේ දක්වා

1.6.6 ගාලු උරුමය පදනමේ පරිපාලන නිලධාරී තනතුර දැරූ අයගේ නොරතුරු

අනු අංකය	නම	තනතුරට පත්වූ වසර	සේවාව අවසන් කළ වර්ෂය
1.	හේමනාත් ගුණවර්ධන මහතා	2001.03.01	2003.10.31
2.	පී.ඒ.කරුණාසේන මහතා	2004.03.25	2005.12.31
3.	සීතා පී.ලියනගේ මහත්මිය	2006.01.02	2020.09.04

1.7 ගාලු උරුමය පදනමේ කටයුතු පරිපාලනය හා කළමනාකරණය

ගාලු උරුමය පදනමේ කටයුතු පරිපාලනය හා කළමනාකරණය 1994 අංක 07 දරන ගාලු උරුමය පදනම පනත මගින් "කළමනාකරණ මණ්ඩලය" වෙත පවරනු ලැබ ඇත. (පනතේ 05වන වගන්තිය පරිදි)

1.7.1 ගාලු උරුමය පදනමේ කළමනාකරණ මණ්ඩල සාමාජිකයින් 2021 වර්ෂය

ගාලු උරුමය පදනමේ කළමනාකරණ මණ්ඩලය පහත සඳහන් සාමාජිකයන්ගෙන් සමන්විත වේ.

නිල බලයෙන් පත් වූ සාමාජිකයින්

අනු අංකය	තනතුර	ලිපිනය
1.	දිස්ත්‍රික් ලේකම් - උප සභාපති ගාලු උරුමය පදනම	දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, ගාල්ල
2.	සභාපති -නාගරික සංවර්ධන අධිකාරිය	නාගරික සංවර්ධන අධිකාරිය ,07 වන මහල, සෙත්සිරිපාය, බත්තරමුල්ල
3.	සභාපති ශ්‍රී ලංකා වරාය අධිකාරිය	ශ්‍රී ලංකා වරාය අධිකාරිය ,අංක 19, පල්ලිය පාර ,කොළඹ 01
4.	අධ්‍යක්ෂ ජනරාල්,(මධ්‍යම සංස්කෘතික අරමුදල)	මධ්‍යම සංස්කෘතික අරමුදල,අංක 212/1, බෞද්ධාලෝක මාවත ,කොළඹ 07
5.	අධක්ෂ්‍ය ජනරාල් (වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව)	වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුව, තැ.පෙ.556, නව මහලේකම් කාර්යාලය,මාලිගාවත්ත පාර, කොළඹ 10
6.	ප්‍රාදේශීය ලේකම්(කඩවත්සතර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය)	කඩවත්සතර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය ,වක්වැල්ල පාර , ගාල්ල
7.	ගරු නගරාධිපති (මහ නගර සභාව)	මහ නගර සභාව,කළුවැල්ල පාර ,ගාල්ල
8.	අධ්‍යක්ෂ ,(පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනය)	පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනය, අංක 407, බෞද්ධාලෝක මාවත,කොළඹ 07
9.	සභාපති,(ජාතික ජලජ සම්පත් ආයතනය (නාරා)	ජාතික ජලජ සම්පත් ආයතනය (නාරා), කාක දූපත, මට්ටක්කුලිය, කොළඹ 07
10.	අංශ ප්‍රධානි, ස්මාරක හා	ස්මාරක හා ස්ථානවල ගෘහ නිර්මාණ ශිල්පය ආරක්ෂා කිරීම

අනු අංකය	තනතුර	ලිපිනය
	ස්ථානවල ගෘහ නිර්මාණ ශිල්පය ආරක්ෂා කිරීම පිළිබඳ අධ්‍යන අංශය (වාස්තු විද්‍යා අධ්‍යයන අංශය)	පිළිබඳ අධ්‍යන අංශය ,මොරටුව විශ්ව විද්‍යා, (වාස්තු විද්‍යා අධ්‍යයන අංශය),මොරටු විශ්ව විද්‍යාලය ,මොරටුව
11.	දකුණු පළාත් සංස්කෘතික අමාත්‍ය	දක්ෂිණ පාය ,ලබුදුව, ගාල්ල
12.	අධ්‍යක්ෂ ජනරාල් ,(ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තු)	ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුව, ශ්‍රීමත් මාක්ස් ප්‍රනාන්දු මාවත, කොළඹ 07
13.	සභාපති ,(ශ්‍රී ලංකා නෙදර්ලන්ත විද්‍යාර්ථීන්ගේ සංගමය)	ශ්‍රී ලංකා නෙදර්ලන්ත විද්‍යාර්ථීන්ගේ සංගමය, නො 108, ශ්‍රී විපුලසේන මාවත, කොළඹ 10
14.	අධ්‍යක්ෂ ජනරාල්, (පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව)	පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව, ශ්‍රීමත් මාක්ස් ප්‍රනාන්දු මාවත, කොළඹ 07

අමාත්‍යාවරයා විසින් පත්කරනු ලබන සාමාජිකයන්

අනු අංකය	නම	තනතුර	ලිපිනය	කළමනාකරණ මණ්ඩලයට පත්වූ දිනය
1.	පරාක්‍රම දහනායක මහතා	සභාපති,ගාලු උරුමය පදනම	225, එස්.එච්.දහනායක මාවත, ගාල්ල	2020.01.21
2.	එම්.එස්.චන්ද්‍රසිරි මහතා	පත්කල සාමාජික	අංක 19 ඒ,රැම්පාට් වීදිය , කොටුව,ගාල්ල	2019.02.07 දින සිට මේ දක්වා
3.	බන්දුල නානායක්කාරවසම් මහතා	පත්කල සාමාජික	පොල්හින්දුහේන, කපුගම බටහිර,දෙවුන්දර	2020.01.21
4.	ඇෂ්ලි ඩිවෝස් මහතා	පත්කල සාමාජික	අංක131, ඩබ්.ඒ.ඩි.රාමනායක මාවත, කොළඹ02	2020.01.21
5.	නීතිඥ නාලනී අබේවර්ධන මෙනවිය	පත්කල සාමාජික	අංක 03, පල්ලිය හරස් වීදිය, කොටුව, ගාල්ල	2020.01.21
6.	නීතිඥ ලලිත් පතිරණ මහතා	පත්කල සාමාජික	අංක 63, ප්‍රදීපාගාර වීදිය, කොටුව,ගාල්ල	2020.01.21

නිල බලයෙන් පත්වූ සාමාජිකයන් විසින් "තෝරාපත් කර ගන්නා සාමාජිකයන්"

මෙම සාමාජිකයින්ගේ ධුර කාලය වසර 02 කි.

අනු අංකය	නම	තනතුර	ලිපිනය	කළමනාකරණ මණ්ඩලයට පත් වූ දිනය
1.	ජයතිස්ස හේරත් මහතා	සභාපති, ශ්‍රී ලංකා අයිකොමස් ආයතනය	නො 317/3, වැකන්ද පාර, හබරකඩ, හෝමාගම	2019.07.28 සිට 2021.07.27 දක්වා
2.	ආචාර්ය නිලාන් කුරේ මහතා	වරලත් වාස්තු විද්‍යාඥ	නො. 111/1, ද මැල් පාර, කටුබැද්ද, මොරටුව	2019.07.28 සිට 2021.07.27 දක්වා
3.	ආචාර්ය පී.එන්.මීගස්වත්ත මහතා	ලේකම් ජනරාල් ශ්‍රී ලංකා යුනෙස්කෝ ජාතික කොමිෂන් සභාව	ශ්‍රී ලංකා යුනෙස්කෝ ජාතික කොමිෂන් සභාව , 05වන මහල, ඉසුරුපාය, බත්තරමුල්ල	2019.07.28 සිට 2021.07.27 දක්වා
4.	නුවන් ජේ. වෙදසිංහ මහතා	නියෝජ්‍ය පොලිස්පති , ගාල්ල දිසාව	නියෝජ්‍ය පොලිස්පති කාර්යාල , කොටුව, ගාල්ල	2020.10.29
5.	දිලේකා කුඩාච්චි මිය	ආණ්ඩුකාර ලේකම්	ආණ්ඩුකාර ලේකම් කාර්යාලය, පහල ඩික්සන් පාර, ගාල්ල	2020.08.27
6.	ඩබ්.එච්.විජේරත්න මහතා	නිටපු සභාපති ,දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව.	දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව, ගාල්ල	2019.07.28 සිට 2021.07.27 දක්වා

II වන පරිච්ඡේදය

2021 ගාලු උරුමය පදනම විසින් සිදු කරන ලද වැඩසටහන්

ගාලු උරුමය පදනම පිහිට වූ දා සිට මේ දක්වා ගාලු උරුමය පදනමේ සේවාවන් සළකා බැලීමේදී මෑත කාලය තුල කැපී පෙනෙන වෙනසක් සහිත සේවාවන් රැසක් ගාල්ල කොටුව වාසී ජනතාවට ලබා දීමට ගාලු උරුමය පදනමට හැකි වී ඇත.

2.1 පොදු වැඩසටහන්

නව වසර සැමරීම 2021.01.01

2021 වසරේ ජනවාරි 01 වන දින රාජකාරී කටයුතු ආරම්භයට ප්‍රථමව , කාර්යාලයේ සියලුම නිලධාරීන් හා සහෝදර ආයතන නිලධාරීන්ගේ ද සහභාගීත්වය ඇතිව ආගමික වතාවත් වල යෙදෙමින් සෙත්පිරිත් සව්ඡායනයක් ශ්‍රවනයකර එහි ආශිර්වාද ලබා ගෙන සියලු දෙනා එක්ව කැවිලි පෙවිලිවලින් යුතු සංග්‍රහයක් භුක්තිවිඳ සතුටින් සාමයෙන් සුහදව රාජකාරී කටයුතු ආරම්භ කරන ලදී. මෙය ගාලු උරුමය පදනම විසින් කරනු ලබන සංස්කෘතිමය වැඩසටහනක් වන අතර, සියලු පිරිවැය දරනු ලබන්නේ නිලධාරීන් වීම විශේෂ වේ.





2.2 සංවර්ධන ව්‍යාපෘති

2.2.1 ගාලු උරුමය පදනම ප්‍රධාන කාර්යාලය පවත්වාගෙන යන ගොඩනැගිල්ල අලුත්වැඩියා කිරීමේ ව්‍යාපෘතිය

ගාලු උරුමය පදනම කාර්යාලය පවත්වාගෙන යනු ලබන්නේ ගාල්ල කොටුව අංක 12, රැම්පාට් විදියේ පිහිටි ගොඩනැගිල්ලකි. මෙම ගොඩනැගිල්ල ලන්දේසි යුගයේ වෙඩි බෙහෙත් ඇඹරුම්හලක් ලෙස භාවිතා කර ඇති ඓතිහාසික ගොඩනැගිල්ලකි. මෙම ගොඩනැගිල්ල කාර්යාලයක් ලෙස භාවිතා කිරීමේදි අත්‍යවශ්‍ය නඩත්තු කටයුතු කිහිපයක් කළයුතුව පැවතුණි. ඒ අනුව පහත සඳහන් නඩත්තු සහ අලුත්වැඩියා කටයුතු 2021 වර්ෂයේදී සිදු කරන ලදී.

I. කාර්යාලීය වැසිකිළි පද්ධතිය නවීකරණය කිරීම
II. කාර්යාලයේ වහල සකස් කිරීම
III. කාර්යාලයේ ඇතුලත බිත්ති සහ පිටත බිත්ති පිළිසකර කිරීම
IV. කාර්යාලීය දොර ජනෙල් පින්තාරු කිරීම
V. පොදු ප්‍රාග්ධන ස්වභාවයේ නඩත්තු (ජලනල පද්ධතිය අලුත්වැඩියා කිරීම)









2.2.2 ගාලු කොටුවේ පිහිටි රාජ්‍ය ආයතන විසින් භාවිතා කරනු ලබන පැරණි ගොඩනැගිලි සංරක්ෂණය කිරීම සඳහා සැලසුම් සකස් කිරීමේ ව්‍යාපෘතිය

ගාල්ල කොටුවේ පිහිටි වාස්තු විද්‍යාත්මක වශයෙන් ඉහල වැදගත්කමක් සහිත පැරණි ගොඩනැගිලි රාශියක් රජයේ කාර්යාල වශයෙන් භාවිතා කරනු ලබයි. විශේෂයෙන්ම බ්‍රිතාන්‍ය පාලන සමයේ ගාල්ල කොටුව දකුණු පළාතේ ප්‍රධාන පරිපාලන කේන්ද්‍රය බවට පත්කිරීම සඳහා රජයේ කාර්යාල බොහොමයක් පැරණි ලන්දේසි ගොඩනැගිලි වල ස්ථාපනය කරනු ලැබීය. එකී කාර්යාල කිහිපයක්ම ගාල්ල කොටුව තුල පවත්වාගෙන යනු ලබයි. මෙකී ගොඩනැගිලි බොහොමයක් ලෝක උරුමයක් වශයෙන් ගාල්ල කොටුවේ කැපී පෙනෙන විශ්වීය වටිනාකම ඉහල නංවන වැදගත්කම් රැසකින් යුක්ත වේ. ඒ නිසාම එකී ගොඩනැගිලි ඉතාම ප්‍රවේශමෙන් සංරක්ෂණය කර පවත්වාගෙන යාමට පෙළඹවීම ගාලු උරුමය පදනමේ කාර්යභාරය වේ. ඒ අනුව මෙම ව්‍යාපෘතියේ පළමු වෙනි පියවර ලෙස ගොඩනැගිලි ඒකක 06ක සැලසුම් සකස් කරන ලදී.මෙම ව්‍යාපෘතියෙහි ඉතිරි ගෙවීම් මෙම වසරේදී සිදු කරන ලදී.

2.2.3 පැරණි පොලිස් නිල නිවාස ගොඩනැගිල්ල සංරක්ෂණය කිරීම

2021.09.29 වන දින ලංසු ලේඛන කාක්ෂණික ඇගයීම් කමිටුවට යෙමුකරන ලදී. එහිදී යම් යම් සංශෝධන ඉදිරිපත් කල නිසා ලංසු ලේඛන සංශෝධනය කිරීමට උපදේශක ආයතනයට (CECB) යොමුකර ඇත. සංශෝධිත ලංසු ලේඛන ලැබුනු විට නැවත කාක්ෂණික ඇගයීම් කමිටුවේ (TEC) අනුමැතිය ලබාගෙන ප්‍රසම්පාදන කමිටුවේ (PC) අනුමැතියට යොමුකිරීමට නියමිතය. 2021.12.31 වන විටත් අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුව මගින් පොලිස් නිවාස ගොඩනැගිල්ලේ ප්‍රසම්පාදනය සිදු කරමින් පැවතුණි. ගාලු උරුමය පදනම මගින් ස්වයං අදායම් උත්පාදන මාර්ගයක් ලෙස පොලිස් නිල නිවාස ගොඩනැගිල්ල සංරක්ෂණය කෙරෙහි විශේෂ අවධානයක් යොමු කරන අතර ඒ තුළින් අමාත්‍යාංශය මත පැවරෙන වැය බර අඩු කිරීම අපේක්ෂා කෙරේ.

2.2.8 තොරතුරු මධ්‍යස්ථානයේ නවීකරණ කටයුතු

ගාලු උරුමයට අයත් බාලදක්ෂ මාවතේ පිහිටි තොරතුරු මධ්‍යස්ථානය පිටත බිත්තියේ පැරණි ප්ලාස්ටරය ඉවත් කර නැවත නව ප්ලාස්ටරයක් යෙදීම සිදු කරන ලදී. සම්පූර්ණම මධ්‍යස්ථාන ගොඩනැගිල්ල සහ උළුවහු ජනෙල් පින්තාරු කිරීම, පිටුපස පැති ගල් බැම්ම සැකසීම සහ ආරක්ෂිත දැවමය වැටක් ඉදිකිරීම කරන ලදී. මෙමගින් පිටස්තර පුද්ගලයන්ගේ අනාරක්ෂාකාරී පිවිසීම් නැවතීමට හැකිවිය.







2.3 වෙනත් වැඩසටහන්

I. යුනෙස්කෝ සංවිධානය විසින් ගාලු කොටුව ලෝක උරුමයක් ලෙස ප්‍රකාශයට පත් කරන ලද්දේ 1988 දෙසැම්බර් මස 09 දිනය. මෙම දිනය සමරනු වස් ගාලු උරුමය පදනම 2019 ඔක්තෝබර් මස 15 වන දින ගාලු කොටුවේ පාසල් දෙක අතර මෙම චිත්‍ර තරඟයක් පවත්වන ලද අතර මෙම චිත්‍ර තරගයේ ජයග්‍රාහිකාවන්ට තෑගි සහ සහතික පත්‍ර බෙදා දීම 2021.03.12 වන දින ගාලු උරුමය පදනම කාර්යාලයේදී සිදු කරන ලදි. ගාලු උරුමය පදනමේ සභාපතිතුමාගේ මූලිකත්වයෙන් සහ අධ්‍යක්ෂතුමාගේ සහභාගිත්වයද , ජයග්‍රාහිකයන්ගේ දෙමව්පියන්ගේ සහභාගිත්වයෙන් පවත්වන ලදී.





II. 2021.01.02 දින ජාතික උරුම,ප්‍රාසාංග කලා හා ග්‍රාමීය කලා ශිල්පී ප්‍රවර්ධන කටයුතු රාජ්‍ය අමාත්‍යාංශයේ ගරු රාජ්‍ය අමාත්‍ය විදුර වික්‍රමනායක මැතිතුමා සහ දේශපාලන නියෝජිතයින් කිහිපදෙනෙක් ද ගාලු උරුමය පදනමට පැමිණ ආයතනික කටයුතු සහ ගාලු කොටුවේ සංවර්ධන කටයුතු පිළිබඳව රැස්වීමක් පවත්වන ලදී. ඉන්පසුව ගරු ඇමතිතුමා ඇතුළු පිරිස ගාලු කොටුවේ ක්ෂේත්‍ර චාරිකාවක් සඳහා එක්විය.





III. 2021.07.26 ජාතික උරුම,ප්‍රාසාංග කලා හා ග්‍රාමීය කලා ශිල්පී ප්‍රවර්ධන කටයුතු රාජ්‍ය අමාත්‍යාංශයේ ලේකම් කේ.ඒ.ඩී.ආර්.නිශාන්ති ජයසිංහ මහත්මිය ගාලු උරුමය පදනමට පැමිණ නිලධාරීන් සමඟ සාකච්ඡාවක් පවත්වන ලදී. එහිදී කාර්යාලීය කටයුතු සහ ආයතනික කටයුතු පිළිබඳව සාකච්ඡා කල අතර ඉන්පසු ගාලු කොටුවේ ක්ෂේත්‍ර චාරිකාවක් සිදු කරන ලදී.




IV. 2021.08.13 දින ගරු අමාත්‍ය විදුර වික්‍රමනායක මැතිතුමා ගාලු උරුමය පදනම කාර්යාලයට පැමිණීම සහ ගාලු කොටුවේ සංචාරය

ජාතික උරුම,ප්‍රාසාංග කලා හා ග්‍රාමීය කලා ශිල්පී ප්‍රවර්ධන කටයුතු රාජ්‍ය අමාත්‍යාංශයේ ගරු රාජ්‍ය අමාත්‍ය විදුර වික්‍රමනායක මැතිතුමා සහ අමාත්‍ය ලේකම් කේ.ඒ.ඩී.ආර්.නිශාන්ති ජයසිංහ මහත්මිය ගාලු උරුමය පදනමට පැමිණ නිලධාරීන් සමඟ ගාලු උරුමය පදනම සම්බන්ධව ප්‍රගති සමාලෝචනයක් පවත්වන ලදී






ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. GAL/E/GHF/2021/FA/39 ඔබේ අංකය / உமது இல. / Your No. දිනය / திகதி / Date 2022 මැයි 27 දින

03/06/2022

ගාලු උරුමය පදනම
631
03 JUN 2022

සභාපති,

ගාලු උරුමය පදනම.

ගාලු උරුමය පදනමේ 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

යථෝක්ත වාර්තාව මේ සමඟ එවා ඇත.

ඩබ්ලිව්.පී.සී වික්‍රමරත්න
විගණකාධිපති

පිටපත් :- 1. ලේකම් - මුදල් අමාත්‍යාංශය

2. ලේකම් - ජාතික උරුම, ප්‍රාසාංග කලා හා ග්‍රාමීය කලා ශිල්පී ප්‍රවර්ධන කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය

අංක 306/72, පොල්දුව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No: 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. GAL/E/GHF/2021/FA/39

ඔබේ අංකය / உமது இல. / Your No.

දිනය / திகதி / Date 2022 මැයි 20 දින

සභාපති,

ගාලු උරුමය පදනම.

ගාලු උරුමය පදනමේ 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් තොරතුරු හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මතය

ගාලු උරුමය පදනමේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ඉම්කම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ පිඩනය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

ගාලු උරුමය පදනමේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2021දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සකය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම්, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම් යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 ගාලු උරුමය පදනමේ 2021 වාර්ෂික වාර්තාවේ ඇතුළත් අනෙකුත් තොරතුරු

මෙම විගණන වාර්තාවේ දිනට පෙර මා ලබාගත් ගාලු උරුමය පදනමේ 2021 වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇති නමුත් මූල්‍ය ප්‍රකාශන සහ ඒ පිළිබඳව වූ මගේ විගණන වාර්තාවේ ඇතුළත් නොවන තොරතුරු, අනෙකුත් තොරතුරු යන්නෙන් අදහස් වේ. මෙම අනෙකුත් තොරතුරු සඳහා කළමනාකරණය වගකිව යුතුය.

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ මගේ මතයෙන් අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර මම ඒ පිළිබඳ කිසිදු ආකාරයක සහතිකවීමක් හෝ මතයක් ප්‍රකාශ නොකරමි.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මගේ විගණනයට අදාළව, මගේ වගකීම වන්නේ ඉහත සඳහනාගත් අනෙකුත් තොරතුරු කියවීම සහ එසේ කිරීමේදී අනෙකුත් තොරතුරු මූල්‍ය ප්‍රකාශන සමඟ හෝ විගණනයේදී හෝ වෙනත් ආකාරයකින් ලබාගත් මගේ දැනුම අනුව ප්‍රමාණාත්මක වශයෙන් නොගැලපෙනවාද යන්න සලකා බැලීමයි.

මෙම විගණන වාර්තාවේ දිනට පෙර මා ලබාගත් අනෙකුත් තොරතුරු මත හා මා විසින් කරන ලද කාර්යයන් මත පදනම්ව, මෙම අනෙකුත් තොරතුරු ප්‍රමාණාත්මක වශයෙන් වැරදි ලෙස මට වාර්තා කිරීමට කිසිවක් නැත.

1.4 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, ගාලු උරුමය පදනම අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය ගාලු උරුමය පදනම් ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් කැබීම හා පදනමේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

ගාලු උරුමය පදනමේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධයෙන් පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, ගාලු උරුමය පදනමේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උපරිම මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය ඉදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි කනි හෝ සාමූහික ලෙස බලපෑම් නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයක් ඇතිවිය හැකි

අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් සරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් කවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමෙදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, වෙනතාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් ගාලු උරුමය පදනමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබෙද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම් යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු යැයි, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල වැදගත් හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සම්පූර්ණ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

02. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

2.1.1 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවයන් අනුව, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබා ගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය ධාර්තා පදනම පවත්වාගෙන ගොස් තිබුණි.

2.1.2 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පදනමේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2.1.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදු කරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

2.2 අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුල, පහත සඳහන් ප්‍රකාශ කිරීමට කරුණු කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

2.2.1 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඈ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ගාලු උරුමය පදනමේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට පදනමට සම්බන්ධවී යම් ගිවිසුමක්

සම්බන්ධයෙන් සාපුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්ත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

2.2.2 2018 අංක 19 දරණ විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණයන් හැර යම් අදාළ ලිඛිත නීතියකට හෝ පදනමේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

නීති,රීති/ විධානයට යොමුව	නිරීක්ෂණ
(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 41(1) වගන්තිය	විගණනය කරනු ලබන සෑම අස්ථිත්වයක් සඳහාම අවස්ථාවෝචිත පරිදි විගණන හා කළමනාකරණ කමිටු පිහිටවිය යුතු වුවද, ගාලු උරුමය පදනම විසින් 2021 වර්ෂය අවසානය දක්වා විගණන හා කළමනාකරණ කමිටුවක් පිහිටුවා ක්‍රියාත්මක කර නොතිබුණි.
(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 15 (3), (අ) වගන්තිය	රජයේ මූල්‍ය ප්‍රකාශන යන්නට ඇතුළත් විය යුතු සමාලෝචිත වර්ෂය සඳහා වූ කාර්යසාධන වාර්තාව 2021 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කර නොතිබුණි.

2.2.3 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ගාලු උරුමය පදනමේ බලතල , කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

2.2.4 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ගාලු උරුමය පදනමේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව

6

2.3 අනෙකුත් කරුණු

(අ) ගාලු උරුමය පදනම විසින් 2021 වර්ෂය සඳහා පිළියෙල කර තිබූ අයවැය ලේඛන අනුව වර්ෂයේ ක්‍රියාකාරකම් සඳහා ඇස්තමේන්තුගත වටිනාකම් හා සත්‍ය වශයෙන් දරා තිබූ වියදම් අතර සැලකිය යුතු විචලතා පැවති අතර එම විචලනයේ ප්‍රතිශතය සියයට 66 සිට සියයට 99 ක් දක්වා විය.

(ආ) තිරසර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ වසර 2030 "න්‍යාය පත්‍රය" ප්‍රකාරව සෑම රාජ්‍ය ආයතනයක් විසින්ම කටයුතු කළ යුතුව පවතින අතර සමාලෝචිත වර්ෂයට අදාළව පදනම විසින් තම විෂය පථය යටතට ගැනෙන කාර්යයන් සම්බන්ධයෙන් කෙසේ ක්‍රියාත්මක විය යුතුද යන්න පිළිබඳව දැනුවත් වී තිබුණද, තිරසර සංවර්ධන ඉලක්ක කරා ළඟා වීම සඳහා ආයතනය විසින් හඳුනාගත් කාර්යයන් වාර්ෂික සැලැස්මට ඇතුළත් කර නොතිබූ අතර එම කාර්යයන් ඉටු කිරීමට අවශ්‍ය වන මූල්‍ය ප්‍රතිපාදනයන් වාර්ෂික අයවැයට ඇතුළත් කර නොතිබුණි.

(ඇ) ගාලු උරුමය පදනමට වැඩි බලතල ලබා ගැනීමට හා පදනම සඳහා ආදායම් උත්පාදනය නංවාලීමේ යන අරමුණු සඳහා 1994 අංක 07 දරන ගාලු උරුමය පදනම් පනත සංශෝධනය කිරීමේ අවශ්‍යතාවය හඳුනාගෙන ඒ සඳහා 2015 වර්ෂයේදී අමාත්‍ය මණ්ඩල සංදේශයක් පිළියෙල කර තිබුණද, සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විටත් එම පනතේ සංශෝධනයක් සිදු කර නොතිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂය තුළ ව්‍යාපෘති 12 ක් සඳහා රු.මිලියන 25.8 ක ප්‍රතිපාදන අනුමත කර තිබුණු අතර ඉන් රු.මිලියන 17.55 ක ප්‍රතිපාදන සමඟක් වැය කර තිබුණි. අනුමත ප්‍රතිපාදන වලින් රු.මි 12.05 ක ප්‍රතිපාදන වෙන් කරන ලද ව්‍යාපෘති 04 සඳහා රු.මිලියන 1.22 ක වියදමක් දරා තිබුණ නමුත්, එම ව්‍යාපෘති සිදු කිරීමේ අරමුණ ඉටු වී නොතිබුණි.

(ඉ) ගාල්ල කඩවත් සහර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙතින් ගාලු උරුමය පදනම වෙත පවරා තිබූ රු.මිලියන 1,036.5 ක් වූ ඉඩම සහ රු.මිලියන 3.825 කට තක්සේරු කර තිබූ ගොඩනැගිල්ල මහ නගර සහා සහ බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශයෙහි උපාය මාර්ගික නගර සංවර්ධන ව්‍යාපෘතියෙහි නියෝජ්‍ය ව්‍යාපෘති අධ්‍යක්ෂ වෙත ගාල්ල කොටු බැම්ම සංරක්ෂණය කිරීමේ ව්‍යාපෘතියේ කොන්ත්‍රාත් සමාගම් වෙත කාවකාලික නවාතැන් සඳහා ගොඩනැගිල්ල වසරක කාලයක් සඳහා භාවිතා කිරීමට අවසර දී එහි කාලය දීර්ඝ කරමින් වසර 02 ½ කාලයක් තුළ කොන්ත්‍රාත් සමාගම එහි රැඳී සිටියද, කොන්ත්‍රාත් සමාගමෙන් බදු මුදලක් අයකර ගෙන නොතිබුණි. එසේම, ගොඩනැගිල්ල සංරක්ෂණය කිරීම සඳහා 2021 වර්ෂයේ වාර්ෂික අයවැය ප්‍රතිපාදන රු.මිලියන 7.85 ක් වෙන් කර ගෙන තිබුණද, දඟළ ගොඩනැගිල්ල කොන්ත්‍රාත්කරුවන් නේවාසිකව සිටි බැවින් එහි අළුත්වැඩියා කටයුතු කිරීමට පදනමට නොහැකි වී තිබුණි.

ඩබ්ලිව්. පී. සී. වික්‍රමරත්න
විගණකාධිපති

2.4 2021 වර්ෂය තුළ ගාලු උරුමය පදනමේ කාර්යසාධනය පිළිබඳව සංක්ෂිප්ත වාර්තාව

I. 2020 වර්ෂය සඳහා ගාලු උරුමය පදනමේ ගිණුම් ප්‍රකාශන සඳහා තත්වාගණනය නොකළ විගණන මතයක් (unqualified Opinion) ලබා ගැනීමට සමත් වී ඇත.

II. ගාලු උරුමය පදනම ප්‍රධාන කාර්යාලය පවත්වාගෙන යන ගොඩනැගිල්ල අලුත්වැඩියා කිරීමේ ව්‍යාපෘතිය සිදු කිරීම.

III. ගාලු කොටුවේ පිහිටි රාජ්‍ය ආයතන විසින් භාවිතා කරනු ලබන පැරණි ගොඩනැගිලි සංරක්ෂණය කිරීම සඳහා සැලසුම් සකස් කිරීමේ ව්‍යාපෘතිය සිදු කිරීමේ ඉතිරි ගෙවීම් සිදු කිරීම.

IV. පැරණි පොලිස් නිල නිවාස ගොඩනැගිල්ල සංරක්ෂණය කිරීම.

V. ගාලු කොටුවේ පැරණි ඇලි වීදි සංවර්ධනය කිරීම.

VI. ගාලු කොටුවේ ඇලි වීදි 3ක් කොන්ක්‍රීට් කැට අල්ලා සංවර්ධනය කරනු ලැබීය.ඒ යටතේ

- නව පටුමඟ I.
- පරවා වීදී ඇලි වීදී.
- රැම්පාට් විදියේ ඇලි වීදී සංවර්ධනය කරනු ලැබිය.

VII. ගාලු උරුමයට අයත් සිප්නාරා පරිශ්‍රය බොජුන්හලක් ලෙස සංවර්ධනය කිරීම.

VIII. සඳු ගැලරියේ සංවර්ධන කටයුතු සිදු කිරීම.

IX. ගාලු කොටුව ප්‍රදීපාගාරය අසල වෙරළ තීරය සංවර්ධනය කිරීම.

- ප්‍රදීපාගාර වෙරළ තීරයේ ජීවිත ආරක්ෂක ඒකකයක් (Life Guard Unit) ස්ථාපනය කිරීම.
- ප්‍රදීපාගාර වෙරළ තීරයේ ආරක්ෂිත සීමා සලකුණු කිරීම.
- ඇදුම් මාරු කිරීම සඳහා ආවරණයක් ස්ථාපනය කිරීම.

X. තොරතුරු මධ්‍යස්ථානයේ නවීකරණ කටයුතු සිදු කිරීම.

2.5 කාර්යසාධනය වර්ධනය කර ගැනීම සඳහා අනුගමනය කිරීමට අපේක්ෂිත කෙටිකාලීන හා මධ්‍යකාලීන ක්‍රියාමාර්ග

<u>මධ්‍යමකාලීන</u>

(ආ) 2021 වර්ෂයේදී ආදායම් උත්පාදන ව්‍යාපෘති 03ක් හඳුනා ගෙන ඇත.

I. ට්‍රයිටන් මුර අට්ටාලයේ කඩ කාමර බදු දීම
II. සිප්නාරා ගොඩනැගිල්ල හෙළ බොජුන් හලක් පවත්වාගෙන යාම සඳහා සියලු කටයුතු සම්පාදනය කර ඇත.
III. පැරණි පොලිස් නිල නිවාස ගොඩනැගිල්ලේ භුක්තිය ගාලු උරුමය පදනමට පවරා ඇති නිසා එම ගොඩනැගිල්ලේ කාමර 07ක් ව්‍යාපාරික ප්‍රජාවට බදු පදනම මත ලබා දීමට අපේක්ෂා කෙරේ.

<u>කෙටි කාලීන</u>

I. ගාලු උරුමය පදනම සඳහා ව්‍යාපාරික සැලැස්මක් (Business Plan) පිළියෙළ කොට වෙනත් කටයුතු සඳහා මධ්‍යම රජයෙන් දැරීමට සිදුවන වැයබර අවම කිරීමට අපේක්ෂා කෙරේ.
II. පණත සංශෝධනය

2.6 අමාත්‍ය මණ්ඩලයේ අවධානය යොමුවිය යුතු ආයතනයට වැදගත් වෙනත් කරුණු

- අනුමත බඳවා ගැනීමේ පටිපාටි සංශෝධනය කර ගැනීම
- ගාලු උරුමය පදනම පනත සංශෝධනය

විගණන නිරීක්ෂණ ක්ෂේත්‍රය	විගණන නිරීක්ෂණය	විගණන නිර්දේශය	කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම	කළමනාකරණ මණ්ඩල සාමාජිකයන්ගේ යෝජනා
1.5 නීති,රීති,රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම	විගණනය කරනු ලබන සෑම අස්පීත්වයක් සඳහාම අවස්ථාවෝචිත පරිදි විගණන හා කළමනාකරණ කමිටු පිහිටවිය යුතු වුවද, ගාලු උරුමය පදනම විසින් 2021 වර්ෂය අවසානය දක්වා විගණන හා කළමනාකරණ කමිටුවක් පිහිටුවා ක්‍රියාත්මක කර නොතිබුණි.	කළමනාකරණ කමිටු පිහිටුවා තිබුණද, 2021 ජුනි 06 දක්වා ක්‍රියාත්මක කර නොමැති බැවින් කමිටු පිහිටුවා ක්‍රියාත්මක කළ යුතුය.	විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් සඳහා අදාළ නිලධාරීන්ගෙන් සමන්විත කමිටු සංයුතියක් 2021 අප්‍රේල් 21 වන දින ගාලු උරුමය පදනමේ අධ්‍යක්ෂ හා සභාපති වෙත යොමු කරන ලද අභ්‍යන්තර ලිපියක් මගින් යෝජනා කර අනුමැතිය ලබා ගන්නා ලදි. 2022 වර්ෂයේ පළමු, දෙවන හා තෙවන කාර්තු ආවරණය කරමින් විගණන හා කළමනාකරණ කමිටු රැස්වීමක් 2022 අගෝස්තු මස 17වන දින ගාලු උරුමය පදනම කාර්යාල පරිශ්‍රයේදී පැවැත්විය.	කළමනාකාරිත්වය විසින් මේ සඳහා ගෙන ඇති පියවර සම්බන්ධව කළමනාකරණ මණ්ඩලයේ එකඟතාව ලබාදුනි. කමිටු රැස්වීම් zoom තාක්ෂණය ඔස්සේ පැවැත්වීමේ කාලෝචිත බව කළමනාකරණ මණ්ඩලය විසින් අවධාරණය කරන ලදී.
	රජයේ මූල්‍ය ප්‍රකාශන යන්නට ඇතුළත් විය යුතු සමාලෝචිත වර්ෂය සඳහා වූ කාර්යසාධන වාර්තාව 2021 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කර නොතිබුණි.	වාර්ෂික වාර්තාවට පසුගිය වර්ෂයේ විගණන වාර්තාව ඇතුළත් කර පිළියෙල කළ යුතුය.	සමාලෝචිත වර්ෂයේ කාර්යසාධන වාර්තාව සඳහා 2021වර්ෂය වෙනුවෙන් විගණකාධිපති දෙපාර්තමේන්තුව මඟින් නිකුත් කරන විගණකාධිපති වාර්තාවෙහි ත්‍රෛභාෂා පිටපත් හා විගණනයට බඳුන්	කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම් හා එකඟ වේ.

			කරන ලද 2021වර්ෂයේ ගිණුම් වාර්තාවද ඇතුළත් කළ යුතුව ඇති අතර, එම වාර්තාවන් තවමත් ලැබී නොමැති බැවින් එහි වැඩ කටයුතු අවසන් කළ නොහැකි වීම හේතුවෙන් මෙලෙස කෙටුම්පත් කරන ලද වදන් සැකසුම් මෘදු පිටපත ලැබීමට සැලැස් වූ බව	
2. මූල්‍ය සමාලෝචනය 2.1 මූල්‍ය ප්‍රතිඵලය	(අ) ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මෙහෙයුම් කටයුතු වල ප්‍රතිඵලය රු.584,118 ක ඌනතාවයක් වූ අතර, ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.55,286 ක් විය. ඉකුත් වර්ෂය සමඟ සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ රු.639,404 ක් හෙවත් සියයට 1157 ක පිරිහීමක් පෙන්නුම් කෙරුණි.		සමාලෝචිත මූල්‍ය වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය පෙර වසරවලට සාපේක්ෂව පහළ අගයක් ගැනීම සඳහා සමස්ත අයභාරය 7.4%කින් අඩු වීම ප්‍රධාන වශයෙන් බලපෑම් සිදු කරන ලදී. මේ සඳහා පහත කත්ත්වයන් අභිතකර අයුරින් බලපාන ලදී. • 2021 වර්ෂයේ පැවති කොවිඩ්-19 ගෝලීය වසංගත තත්වය හේතුවෙන් පුනරාවර්තන වියදම් දැරීම වෙනුවෙන් වන වාර්ෂික ප්‍රතිපාදනයන් උපරිම වශයෙන් රජයෙන් නොලැබුණු අතර සමාලෝචිත	කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම හා එකඟ වේ.

	(ආ) 2017 වර්ෂයේ රු.8,231,924 ක් වූ දායකය 2018 වර්ෂයේදී රු.6,586,024 ක් දක්වා අඩු වුවත් 2019 වර්ෂයේදී එය රු.10,788,979 ක් දක්වා වර්ධනය වී තිබූ අතර 2020 සහ 2021 වර්ෂයන්හීදී දායකය පිළිවෙලින් රු.10,530,692 ක් සහ රු.10,499,196 ක් දක්වා අඩු වී තිබුණි.		වර්ෂය වෙනුවෙන් පුනරාවර්තන වියදම් සඳහා රු.මිලියන 12ක ප්‍රතිපාදන වෙන්ව තිබුණ ද ගාලු උරුමය පදනම වෙත අක්මුදල් නිදහස් කර තිබුණේ රු.මිලියන 9.7ක් පමණි. එය 2020 වර්ෂයට සාපේක්ෂව 3.49%ක පිරිහීමකි. තවද අක්මුදල් ප්‍රමාණවත් නොවීම හේතුවෙන් වර්ෂය අවසානයේ උපචිත පුනරාවර්තන ගෙවීම් සඳහා රු.284,670ක ප්‍රතිපාදනයක් ද සිදු කිරීමට සිදුවිය. • කොවිඩ්-19 ගෝලීය වසංගත තත්ත්වයේ බලපෑම හේතුවෙන් බදු ආදායම් ඉපැයීම් ද පෙර වසරට සාපේක්ෂව 100%කින් ම පසුබෑමට ලක්විය. • රජය විසින් ව්‍යවස්ථාපිත පොලී අනුපාතය පහළ දැමීම හේතුවෙන් පදනමේ පොලී ආදායම් ඉපයීමේ ආදායම් ප්‍රභවය ද 6.35%කින් පහළ යන ලදී. • සමස්ත පුනරාවර්තන වියදම් දැරීම පෙර වසරට සාපේක්ෂව 2.24%කින් පහළ බැස තිබුණද, සමාලෝචිත වර්ෂයේ දී කාර්යාල පරිපාලන වියදම් පෙර වර්ෂයට	

			සාපේක්ෂව 3.57%කින් වර්ධනය වී තිබූ අතර ඒ සඳහා පහත කරුණු හේතු සාධක විය. • සමාලෝචික වර්ෂයේ දී ගාලු උරුමය පදනමට පවරාදෙන ලද පොලිස් නිල නිවාස ගොඩනැගිල්ල සහ ප්‍රවේණිගත වත්කම් කාණ්ඩයට අයත් තොරතුරු මධ්‍යස්ථානය පවත්වාගෙන යන පෞරාණික ගොඩනැගිල්ල රජයේ තක්සේරු දෙපාර්තමේන්තුව මඟින් තක්සේරු කරන ලද අතර මෙම වසරේ සිට ක්ෂය කිරීම් ද 5% බැගින් සිදු කිරීමට කටයුතු කරන ලදී. මේ හේතුවෙන් පෙර වසරට සාපේක්ෂව සමාලෝචික වර්ෂයේ ක්ෂය වියදම 8.89%කින් වර්ධනය විය.	

3. මෙහෙයුම් සමාලෝචනය **3.1 කළමනාකරණ ආකාර්යක්ෂමතා**	(අ) ගාලු උරුමය පදනමට වැඩි බලතල ලබා ගැනීමට හා පදනම සඳහා ආදායම් උත්පාදනය නංවාලීමේ යන අරමුණු සඳහා 1994 අංක 07 දරන ගාලු උරුමය පදනම පනත සංශෝධනය කිරීමේ අවශ්‍යතාවය හඳුනාගෙන ඒ සඳහා 2015 වර්ෂයේදී අමාත්‍ය මණ්ඩල සංදේශයක් පිළියෙල කර තිබුණද, සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විටත් එම පනතේ සංශෝධනයක් සිදු කර නොතිබුණි.	පනත සංශෝධනය කරවා ගැනීමට කටයුතු කළ යුතුය.	2018 වර්ෂයේදී එවකට පැවති රජය විසින් ගාලු උරුමය පදනම සඳහා නව පනතක් සකස් කිරීමට අවශ්‍ය මූලික කටයුතු ආරම්භ කර තිබුණි. එහිදී දැනට පවතින පනත සංශෝධනය කිරීමක් අපේක්ෂා නොකළ අතර දක්ෂිණ සංවර්ධන අමාත්‍යාංශයේ මූලිකත්වයෙන් නව පනතක් සකස් කිරීමට කටයුතු යොදා තිබුණි. නව කළමනාකරණ මණ්ඩලය එම පනතම සංශෝධනය කිරීමටත් ඒ සඳහා නව යෝජනා සකස් කිරීමටත් 2022 පෙබරවාරි 21 වන දින පැවති කළමනාකරණ මණ්ඩල කමිටු රැස්වීමේදී තීරණය වූ අතර එම යෝජනා අමාත්‍යාංශයට යොමු කර පනත සංශෝධනයට කටයුතු කරනු ලැබේ.	පනත සංශෝධනය සඳහා අවශ්‍ය මූලික කටයුතු මේ වන විට ආරම්භ කර ඇත. ඒ අනුව පනත සංශෝධනය සඳහා කමිටුවක් පත්කර ගෙන ඇති අතර 2022.06.01 වන දින එම කමිටු රැස් වී පනතේ මූලික කරුණු කිහිපයක් සංශෝධනය කිරීම සඳහා සාකච්ඡා කරන ලදී. එම වාර්තාව මේ වන විට අමාත්‍යාංශයට යවා ඇත.
	(ආ) ගාල්ල කඩවත් සතර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙතින් ගාලු උරුමය පදනම වෙත පවරා තිබූ රු.මිලියන 1,036.5 ක් වූ ඉඩම සහ රු.මිලියන 3.825 කට තක්සේරු කර	කොන්ත්‍රාත්කරුගෙන් බදු මුදල් අයකිරීමට කටයුතු කළ යුතුය. ලබාදෙන ප්‍රාග්ධන	පැරණි පොලිස් නිළ නිවාස ගොඩනැගිල්ල භාර දෙනු ලැබුයේ ගාල්ල කොටු බැමිමේ සංරක්ෂණ කටයුතුවල අවශ්‍යතා වෙනුවෙනි. 2020 සහ 2021 වර්ෂවල විවිධ අවස්ථාවල ගෝලීය කොවිඩ් වසංගත	මෙම ගොඩනැගිල්ල උපාය මාර්ගික නගර සංවර්ධන ව්‍යාපෘතියට ලබා දී තිබූ බැවින් බදු මුදල් අයකර ගැනීමට නොහැකි බව පිලිගන්නා ලදී.

	තිබූ ගොඩනැගිල්ල මහ නගර සභා සහ බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශයෙහි උපාය මාර්ගික නගර සංවර්ධන ව්‍යාපෘතියෙහි නියෝජ්‍ය ව්‍යාපෘති අධ්‍යක්ෂ වෙත ගාල්ල කොටු බැම්ම සංරක්ෂණය කිරීමේ ව්‍යාපෘතියේ කොන්ත්‍රාත් සමාගම් වෙත තාවකාලික නවාතැන් සඳහා ගොඩනැගිල්ල වසරක කාලයක් සඳහා භාවිතා කිරීමට අවසර දී එහි කාලය දීර්ඝ කරමින් වසර 02 ½ කාලයක් තුළ කොන්ත්‍රාත් සමාගම එහි රැඳී සිටියද, කොන්ත්‍රාත් සමාගමෙන් බදු මුදලක් අයකර ගෙන නොතිබුණි. එසේම, ගොඩනැගිල්ල සංරක්ෂණය කිරීම සඳහා 2021 වර්ෂයේ වාර්ෂික අයවැය ප්‍රතිපාදන රු.මිලියන 7.85 ක් වෙන් කර ගෙන තිබුණද, අදාළ ගොඩනැගිල්ල කොන්ත්‍රාත්කරුවන් නේවාසිකව සිටි බැවින් එහි අළුත්වැඩියා කටයුතු කිරීමට පදනමට නොහැකි වී තිබුණි.	ප්‍රතිපාදන වලින් අපේක්ෂිත අරමුණු ඉටු කර ගැනීමට කටයුතු කළ යුතුය.	තක්ත්වය හේතුවෙන් ගාල්ල කොටුව සංරක්ෂණ ව්‍යාපෘතියේ වැඩ කටයුතු වර්ෂ 02 කට ආසන්න කාලයක් ප්‍රමාද වූ අතර ගොඩනැගිල්ල භාවිතා කිරීම සඳහා කාලය දීර්ඝ කර දීමක් කිරීමට සිදු විය. 2021 මුල් අවධියේ මෙහි සංරක්ෂණ කටයුතු ආරම්භ කිරීමට පියවර ග ත් අතර, සැලසුම් අනුමත වීම ප්‍රමාද වීම, ඉංජිනේරු ඇස්තමේන්තු සකස් කිරීම සහ ප්‍රසම්පාදන ක්‍රියාවලියේ ප්‍රමාදයන් නිසා ගොඩනැගිල්ල සංරක්ෂණය එතෙක් ප්‍රමාද වුවද, වර්තමානයේ දී එහි සංරක්ෂණ කටයුතු ආරම්භ කිරීමට පියවර ගෙන ඇත.	ව්‍යාපෘති උපදේශකයන්ගෙන් මේ ගැන විමසීමේදී මේ සඳහා මුදල් වෙන්කර නොමැති බව ප්‍රකාශ කර ඇත. මේ වන විට ව්‍යාපෘතිය අවසන්ව ඇති අතර ගොඩනැගිල්ලේ සංරක්ෂණ කටයුතු ආරම්භ කර ඇති බැවින් කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම් හා එකඟ විය.

3.2 මෙහෙයුම් ආකාර්යක්ෂමතා	(අ) සමාලෝචිත වර්ෂය තුළ ව්‍යාපෘති 12 ක් සඳහා රු.මිලියන 25.8 ක ප්‍රතිපාදන අනුමත කර තිබුණු අතර ඉන් රු.මිලියන 17.55 ක ප්‍රතිපාදන පමණක් වැය කර තිබුණි. අනුමත ප්‍රතිපාදන වලින් රු.මි 12.05 ක ප්‍රතිපාදන වෙන් කරන ලද ව්‍යාපෘති 04 සඳහා රු.මිලියන 1.22 ක වියදමක් දරා තිබුණ නමුත්, එම ව්‍යාපෘති සිදු කිරීමේ අරමුණ ඉටු වී නොතිබුණි.	ලබා දෙන ප්‍රතිපාදන වලින් ව්‍යාපෘතිවල අරමුණු ඉටුකර ගැනීමට කටයුතු කළ යුතුය. ඉදිකිරීම් වලට පෙර එය ඉටු කිරීමේ හැකියාව සොයා බැලිය යුතුය.	2021 වර්ෂය තුළදී පැරණි පොලිස් නිළ නිවාස ගොඩනැගිල්ලේ සංරක්ෂණ කටයුතු සිදු කිරීමේ භෞතික ප්‍රගතිය 0%ක් වීම සඳහා සංරක්ෂණ සැලසුම් අනුමැතිය ප්‍රමාදවීම, ඉංජිනේරු ඇස්තමේන්තු පිළියෙල කිරීම ප්‍රමාදවීම, ප්‍රසම්පාදන ක්‍රියාවලිය ප්‍රමාද වීම හා කොරෝනා තත්ත්වය මත විටින්විට රට අගුළු දැමීම හේතු විය. මේ වන විට ගොඩනැගිල්ල සංරක්ෂණය සඳහා කොන්ත්‍රාත් කරුවෙක් තෝරා ගෙන ඇති අතර එහි වැඩකටයුතු ආරම්භ වී ඇත. (ii) ප්‍රදීපාගාර වෙරළ අසල ඇඳුම් මාරු කරන ආවරණය සකස් කිරීමේ කටයුත්ත දකුණු පළාත් කර්මාන්ත සංවර්ධන දෙපාර්තමේන්තුවට භාර දී ඇත. එහි ඉදිකිරීම් කටයුතුවල ප්‍රමාදය නිසා ප්‍රගතිය අඩු මට්ටමක පැවතිණි. (iii) ගාල්ල කොටුවේ ප්‍රදීපාගාර වෙරළ තීරයේ ජීවිතාරක්ෂණ වැඩපිළිවලක් ක්‍රියාත්මක කිරීම සඳහා බෝයාවල් යෙදීමේ ව්‍යාපෘතිය 2021 වර්ෂයේ	ඇඳුම් මාරුකරන ස්ථානයක් මේ වන විට ස්ථාපනය කර ඇති බැවින් කලමණාකාරිත්වයේ අදහස් දැක්වීම හා එකඟ විය.

			දෙසැම්බර් මස අවසන් වනවිට නිම කරන ලදි. ජීවිතාරක්ෂක කුටියක් ඉදිකිරීම සඳහා යෝජිත සැලසුමට සැලසුම් අනුකමිටුව විසින් විරෝධතා දැක්වූ බැවින් ඊට විකල්පයක් වශයෙන් සකස් කරනු ලැබූ බහාලුම් පෙට්ටි දෙකක් ස්ථාපනය කිරීමට යෝජනා විය. වෙරළ තීරයේ කොන්ක්‍රීට් ඉදිකිරීමට ඉඩ නොදීම නිසා බහාලුම් පෙට්ටි ස්ථාපනය කිරීමේ කටයුත්ත නතර කර දමන ලදි. (iv) වීඩියෝව සැකසීම සම්බන්ධයෙන් පිරිවිතර සකස් කිරීම සිදු කරනු ලැබූ අතර මෙම ව්‍යාපෘතිය භාර දීම සඳහා රාජ්‍ය ආයතනයක් වන ශ්‍රී ලංකා පදනම් ආයතනය වීඩියෝ අංශය සමඟ මූලික සාකච්ඡාවක්ද කරන ලදී. එහෙත් ලෝක බැංකු ආධාර යටතේ ගාලු කොටුව සංරක්ෂණය ව්‍යාපෘතිය නිම කිරීම 2021 අවසානය දක්වා ප්‍රමාද වූ බැවින් අවශ්‍ය රූගත කිරීම් කිරීමට අවකාශ නොතිබීම නිසා 2021 වසර තුළ දී මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට නොහැකි විය.	

3.3 මානව සම්පත් කළමනාකරණය	පදනමේ අධ්‍යක්ෂ තනතුර කොන්ත්‍රාත් පදනම මතද, පරිපාලන නිලධාරී තනතුර සහ ආරක්ෂක නිලධාරී තනතුරු 04 ක් අනුමත කර තිබුණද, ඉන් තනතුරු 02 ක පුරප්පාඩු පැවති නමුත්, එම පුරප්පාඩු පුරවා ගැනීමට කටයුතු කර නොතිබුණි	තනතුරු විධිමත් කර ගැනිමට කටයුතු කළ යුතුය.	පරිපාලන නිලධාරී තනතුර පුරප්පාඩුව පැවතිය ද, 2021.01.20 දින NH/Secretory/01 දරන ජාතික උරුම, ප්‍රසංග කලා හා ග්‍රාමීය කලා ශිල්පී ප්‍රවර්ධන කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය මඟින් නිකුත් කරන ලද ලිපියක් මඟින් සියලු බඳවා ගැනීම් තාවකාලිකව අත්හිටුවීම මත සමාලෝචිත වර්ෂය තුළ නිලධාරියෙකු බඳවා ගැනීමට ආයතනයට හැකියාව තිබුණේ නැත. කෙසේ වෙතත් මෙම තනතුර සඳහා නිලධාරියකුගේ දැඩි අවශ්‍යතාවයක් පවතින බැවින් එම තනතුර පිරවීම සඳහා පුවත්පත් දැන්වීමක් සකස්කර අමාත්‍යාංශ ලේකම්ගේ අනුමැතිය ලබාගැනීම සඳහා යොමුකර ඇත.	බඳවා ගැනිම් සඳහා කටයුතු නොකරන ලෙසට නිකුත් කර ඇති භාණ්ඩාගාර වක්‍රලේඛය පරිදි බඳවා ගැනිම් සිදුකර නොමැති වුවත් තවදුරටත් අමාත්‍යාංශය සමඟ සාකච්ඡා කරන බවට කළමණාකරන මණ්ඩලය එකඟ විය.
4. ශිණුම්කටයුතු භාවය හා යහපාලනය	ගාලු උරුමය පදනම විසින් 2021 වර්ෂය සඳහා පිළියෙල කර තිබූ අයවැය ලේඛන අනුව වර්ෂයේ ක්‍රියාකාරකම් සඳහා ඇස්තමේන්තුගත වටිනාකම් හා සත්‍ය වශයෙන් දරා තිබූ වියදම් අතර සැලකිය යුතු විචලතා	අයවැය සැකසීමේදී කෝවිඩ් 19අවධානම් තත්ත්වය හා ද්‍රවශීලතා ගැන සලකා කටයුතු කළ යුතුය.	පොලිස් නිළ නිවස සංරක්ෂණය ප්‍රමාද වීම, මූලික සැලසුම් අනුමත කිරීම් කටයුතු කොරෝනා වසංගතය ප්‍රසම්පාදන කටයුතු ප්‍රමාද විය. 2022 වර්ෂය තුළ සංරක්ෂණ කටයුතු අරඹා ඇත. ජීවිත ආරක්ෂක කුටියක් ඉදි කිරීමේ	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම් හා එකඟ විය.

4.1අයවැය පාලනය	පැවති අතර එම විචලනයේ ප්‍රතිශතය සියයට 66සිට සියයට 99ක් දක්වා විය .		කාර්යය කොටු බැම්ම හරහා බහාලුම් පෙට්ටි දෙකක්බෑමේදී මතුවන අවහිරතා සහ වෙරළ මත කොන්ක්‍රීට් වේදිකා තැනීමට ඇති නොහැකියාව නිසා අක්මුදල් නැවතත් අමාත්‍යාංශය වෙත යවන ලදි. කාර්යාල වියදම් 2021 වර්ෂය තුළ දී පැවති ගෝලීය කොරෝනා වසංගත තත්ත්වය හමුවේ රට තුළ පැවති සංචරණ සීමාවන් හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ දී පැවැත්වීමට නියමිතව තිබූ කළමනාකරණ මණ්ඩල හතරක් පමණක් පැවැත් වීම නිසා ඉතිරි වී ඇති බව වෙනත් වියදම් ගාලු උරුමය පදනම ප්‍රධාන කාර්යාලය දැනට පවත්වාගෙන යන වෙනත් ස්ථානයක කාර්යාලය පවත්වාගෙන යාමට සිදුවහොත් ගෙවීමට සිදුවන බදු මුදල මෙලෙස පූර්වෝක්තව ඇස්තමේන්තු ගත කරන ලදී. වෙනත් වියදම් යටතේ කොග කපා හැරීමේ වියදම සහ කොටුව නඩත්තු කිරීම සඳහා දරන ලද වියදම පමණක්	

			ඇතුළත්ව ඇත.	
4.1 තිරසර සංවර්ධන අරමුණු	(අ) තිරසර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ වසර 2030 "න්‍යාය පත්‍රය" ප්‍රකාරව සෑම රාජ්‍ය ආයතනයක් විසින්ම කටයුතු කළ යුතුව පවතින අතර සමාලෝචිත වර්ෂයට අදාළව පදනම විසින් තම විෂය පථය යටතට ගැනෙන කාර්යයන් සම්බන්ධයෙන් කෙසේ ක්‍රියාත්මක විය යුතුද යන්න පිළිබඳව දැනුවත් වී තිබුණි. එසේ වුවද, පහත දැක්වෙන කරුණු විගණනයේදී නිරීක්ෂණය විය. (i) තිරසර සංවර්ධන ඉලක්ක 02 ක් පමණක් (11, 8) ආයතනය විසින් හඳුනා ගෙන තිබූ අතර, ගාලු කොටුව ආරක්ෂා කර ගනිමින් සංචාරක ආකර්ෂණය වැඩි වන පරිදි තවදුරටත් අවධානය යොමු කළ හැකි පහත සඳහන් ඉලක්කවල ඇතුළත් දර්ශක	හඳුනාගත් ඉලක්ක නියමිත පරිදි සපුරා ගැනීමට කටයුතු කළ යුතුය.	ඔබ විසින් අවධානය යොමු කළ 09 සහ 15 අරමුණු ලභාකරගැනීම සඳහා 2021 වර්ෂයේ දී පහත ව්‍යාපෘති ක්‍රියාත්මක කරන ලදී. i. ගාලුකොටුවේ පැරණි ඇලි වීථි සංවර්ධනය කිරීම / ගාලුකොටුවේ සේවා වීදි තුනක් ඉන්ටලොක් කිරීම. ii. ගාලු කොටුව ප්‍රදීපාගාරය අසල වෙරළ තීරය ඇඳුම් මාරු කිරීම සඳහා ආවරණයක් ඉදි කිරීම. iii. මාසිකව කොටුපවුර පවිත්‍රකිරීමේ ශ්‍රමදාන වැඩසටහන් පැවැත්වීම. iv. ගාලු කොටුවට ආවේණික ශාක සිටුවීම හා ශාක නඩත්තු කිරීමේ කටයුතු. 2022 වර්ෂයේ හඳුනාගන්නා ව්‍යාපෘති සඳහා 9, 15 සහ 17 යන අරමුණු හඳුනා	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම හා එකඟ විය.

	කෙරෙහි ආයතනයේ අවධානය යොමු වී නොතිබුණි. • ප්‍රත්‍යස්ථ වූ යටිතල පහසුකම් තැනීම, අන්තර්ග්‍රහණය හා තිරසර කාර්මීකරණයක් ප්‍රවර්ධනය, නවෝත්පාදනය ධෛර්යමත් කිරීම. • භෞමික පරිසර පද්ධති ආරක්ෂා කර ගැනීම, ප්‍රතිස්ථාපනය කිරීම හා තිරසර භාවිතය ප්‍රවර්ධනය කිරීම, වනාන්තර තිරසර ආකාරයෙන් කළමනාකරණය කිරීම, කාන්තාකරණය වැළැක්වීම, භූමි හායනය වළක්වා එය ප්‍රතිවර්තනය කිරීම හා පෙව විවිධත්වය අහිමි වීම නැවැත්වීම • තිරසර සංවර්ධනය සඳහා වූ ගෝලීය සහයෝගීතාව ක්‍රියාත්මක කිරීමේ සහ නව ජීවයක් දීමේ මාර්ග ශක්තිමත් කිරීම		ගැනීමට අපේක්ෂා කරමි.	
	(ii) තිරසර සංවර්ධන ඉලක්ක කරා ළඟා වීම සඳහා ආයතනය විසින් හඳුනාගත් කාර්යයන් වාර්ෂික	මූල්‍ය ප්‍රතිපාදනයන් වාර්ෂික අයවැයට ඇතුළත් කළ යුතුය.	පිළිනොගනිමි. තිරසර සංවර්ධන ඉලක්ක කරා ළඟා වීම සඳහා ගාලු උරුමය පදනම විසින් හඳුනාගත් කාර්යයන් වාර්ෂික	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම හා එකඟ විය.

	සැලැස්මට ඇතුළත් කර නොතිබූ අතර එම කාර්යයන් ඉටු කිරීමට අවශ්‍යවන මූල්‍ය ප්‍රතිපාදනයන් වාර්ෂික අයවැයට ඇතුළත් කර නොතිබුණි.		සැලැස්මට ඇතුළත් කර තිබූ අතර එම කාර්යයන් ඉටු කිරීමට අවශ්‍යවන මූල්‍ය ප්‍රතිපාදනයන් වාර්ෂික අයවැයට ඇතුළත් කර තිබුණි.	